සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය 2019
# බුද්ධ ධර්මය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ''මම සසර දුකට මුල්වන පංචස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයා සසර නොයෙක් ජාතිවල ඇවිද්දෙමි. එහෙත් දක්නට නොලැබිණි. දැන් මම ඒ වඩුවා දිටිමි.'' බුදුන් වහන්සේ කළ මෙම ප්‍රකාශය අනුව උන්වහන්සේ දුටු වඩුවා වන්නේ,
    (1) නීවරණ ධර්මයන් ය. (2) තණ්හාව ය.
    (3) සතර අගතීන් ය. (4) දස කෙළෙස් ය.

02. වැසිකිළි පරිහරණයේදී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම මුල්කොට ගෙන ධර්මධර හා විනයධර භික්ෂූන් දෙපිරිසක් අතර ඇති වූ කළහකාරී හැසිරීමට හේතු වූ විහාරය වූයේ,
    (1) සැවැත් නුවර ජේතවනාරාමයයි. (2) මගධයේ වේළුවනාරාමයයි.
    (3) කෝසලයේ රාජකාරාමයයි. (4) කොසැඹෑ නුවර ඝෝෂිතාරාමයයි.

03. බුදුරජාණන් වහන්සේ පස්වන වස් කාලය ගත කළේ,
    (1) මකුල පර්වතයේ ය. (2) චාලි පර්වතයේ ය.
    (3) විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය. (4) පාරිලෙය්‍ය වනයෙහි ය.

04. සුචිරෝම, ඛරරෝම, ආලවක වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති
    (1) පුරිසදම්ම සාරථි ගුණයයි. (2) තාදි ගුණයයි.
    (3) අසරණ සරණ ගුණයයි. (4) ගිලනුන්ට උවැටන් කිරීමේ ගුණයයි.

05. ගිලනුන්ට උපස්ථාන කිරීම බුද්ධ චරිතයේ දක්නට ලැබුණු සුවිශේෂී ගුණාංගයකි. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ රෝගී වූ විට උන්වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
    (1) සත්ත බොජ්ඣංග සූත්‍රයයි. (2) මහා මොග්ගල්ලාන සූත්‍රයයි.
    (3) කරණීයමෙත්ත සූත්‍රයයි. (4) රතන සූත්‍රයයි.

06. බෝසතාණන් වහන්සේ දාන ''පරමත්ථ පාරමී'' පාරමිතාව පුරණය කළ බව හෙළිවන ජාතක කථාව වන්නේ,
    (1) තේමිය ජාතකයයි. (2) සස ජාතකයයි.
    (3) සිවි ජාතකයයි. (4) වෙස්සන්තර ජාතකයයි.

07. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම
    (1) අමූලික ශ්‍රද්ධාව නම් වේ. (2) තුන්තරා බෝධිය නම් වේ.
    (3) අවෙච්චප්පසාදය නම් වේ. (4) භක්තිය නම් වේ.

08. ''ප්‍රමාණය දැන ආහාර වැළඳූ විට ආහාර සෙමින් දිරයි. ඔවුන්ගේ ආයුෂය වැඩෙන්නේ ය'' යන අදහස ඇතුළත් වූයේ කුමන සූත්‍රයේදී ද?
    (1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය. (2) පත්තකම්ම සූත්‍රය.
    (3) සිගාලෝවාද සූත්‍රය. (4) දෝණපාක සූත්‍රය.

09. ''උත්සහයෙන් ද, නිවරැදි සිහියෙන් ද යුතුව නිදොස් දේ විමසා බලා කරන දැහැමි දිවි පැවතුම් ඇති යන'' අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,

(1) ''නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති'' යන්නයි.

(2) ''තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පතී'' යන්නයි.

(3) ''උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ'' යන්නයි.

(4) ''අත්තනාව කතං පාපං - අත්තනාව සංකිලිස්සති'' යන්නයි.

10. සිතෙහි පවතින නොසන්සුන් බව විසිරුණු ගතිය සෙලෙවෙන ගතිය ධර්මයේ හැඳින්වෙන්නේ,

(1) උද්ධච්චකුක්කුච්ච නමිනි. (2) ව්‍යාපාද නමිනි.

(3) විචිකිච්ඡාව නමිනි. (4) කාමච්ඡන්දය නමිනි.

11. ක්‍රි.ව. 1906 ජනවාරි 8 වෙනිදා පාසල් අධ්‍යාපනය නතර කර පැවිදි දිවියට ඇතුළත් වූ රුබෙල් ගුණවර්ධන දරුවා පසුව ජනාදරයට පාත්‍ර වූයේ,

(1) නා උයනේ අරියධම්ම හිමි යනුවෙනි. (2) රේරුකානේ චන්දවිමල හිමි යනුවෙනි.

(3) බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි යනුවෙනි. (4) හික්කඩුවේ සුභූති හිමි යනුවෙනි.

12. සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙසින් පිදුම් ලබන්නේ කෝට්ටේ යුගයයි. එම යුගයටම ආවේණික කෘති ත්‍රිත්වයක් වන්නේ,

(1) ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය, අමාවතුර යි.

(2) කව්සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය යි.

(3) කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය, ලෝවැඩ සඟරාව යි.

(4) බුත්සරණ, ලෝවැඩ සඟරාව, කාව්‍යශේඛරය යි.

13. ''මෙය තර්කානුකූල යැයි කියා හෝ න්‍යායානුකූල යැයි කියා හෝ'' යනාදි කරුණු ගෙන හැර දක්වමින් යමක් නොපිළිගත යුතු බව දේශනා කළේ කවුරුන් හට ද?

(1) ශාක්‍ය වංශිකයන්ට ය. (2) කෝලීය වංශිකයන්ට ය.

(3) ලිච්ඡවී වංශිකයන්ට ය. (4) කේසපුත්තයේ කාලාමවරුන්ට ය.

14. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එම ආනිසංස ගණයට ඇතුළත් **නොවන** කරුණක් වූයේ පහත කවරක් ද?

(1) සිහිමුලා වී කලුරිය කිරීම. (2) මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.

(3) මරණින් මතු සුගතියෙහි උපත ලැබීම. (4) කීර්තිය පැතිරීම.

15. ''තණ්හා පච්චයා උපාදානං'' යන්නෙන් පැහැදිලි කරන්නේ,

(1) ඉපදීම නිසා ජරා මරණාදියට පත්වීමයි.

(2) තණ්හාව නිසා සිතින් දැඩිව අල්ලා ගැනීමයි.

(3) සළායතන හේතු කොට ස්පර්ශය ඇති වීමයි.

(4) සත්ත්වයා නැවත සසරට එකතුවීම නිසා සසර ඉපදීම සිදු වීමයි.

16. තෝදෙය්‍ය සුභ තරුණයා බුදුපියාණන් වහන්සේගෙන් පුද්ගල විෂමතාවන්ට හේතුවන කරුණු කීයක් විමසන ලද්දේ ද?

(1) 13 කි. (2) 12 කි. (3) 14 කි. (4) 15 කි.

17. අපරාපරිය වේදනීය කර්ම නමින් හැඳින්වෙන්නේ,

(1) දෙවන භවයේදී විපාක දෙන කර්මයි. (2) මෙලොවදී විපාක දෙනු ලබන කර්මයි.

(3) විපාක නොදී අහෝසි වී යන කර්මයි. (4) කවර හෝ භවයකදී විපාක දෙන කර්මයි.

18. ලෙහෙනුන්ගේ අභය භූමියක් වූ කලන්දක නිවාප නම් ස්ථානයේදී බුදු හිමි විසින් දෙසූ සූත්‍රය වන්නේ,

(1) සාමඤ්ඤඵල සූත්‍රයයි. (2) සිංසපා සූත්‍රයයි.

(3) අම්බට්ඨ සූත්‍රයයි. (4) මහා මොග්ගල්ලාන සූත්‍රයයි.

19. අනුන්ගේ අත් උදව්වක් නැතිව නැගිට ගැනීමට බැරි තරමට අධිකව ආහාර ගන්නා තැනත්තා ධර්මයේ හඳුන්වන්නේ,

(1) ආහාර හත්ථක නමිනි. (2) භුත්තවමිතක නමිනි.

(3) අලංසාටක නමිනි. (4) කාකමාසක නමිනි.

20. දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන්ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපිත මුද්‍රාව වූයේ,

(1) ධ්‍යාන මුද්‍රාවයි. (2) අභය මුද්‍රාවයි. (3) විතර්ක මුද්‍රාවයි. (4) භූමි ස්පර්ශ මුද්‍රාවයි.

21. ''අනවජ්ජානි කම්මානි'' යන්නෙන් අවධාරණය කරන්නේ කවර කරුණක් ද?

(1) කුසලකර්මය. (2) පහත් ක්‍රියා ය. (3) නිවැරදි ක්‍රියා ය. (4) අකුසල කර්මය.

22. නූතන යුගයේ චිත්‍ර කලාවට ඉන්දියානු හා ලාංකීය සම්භාව්‍ය සිතුවම් කලාවේ හා යුරෝපයේ නූතනවාදයේ සිතුවම්වලට සම්මිශ්‍රණයක් එක් කරමින් චිත්‍ර ඇඳි ශ්‍රී ලාංකික කලා ශිල්පියා වූයේ,

(1) එම්. සාර්ලිස් මහතා ය. (2) සොලියස් මෙන්දිස් මහතා ය.

(3) සෝමබන්දු විද්‍යාපති මහතා ය. (4) ඇල්බට් ධර්මසිරි මහතා ය.

23. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේ දී තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක දීම මගහරවා ගත හැකි බව දේශනා කළේ,

(1) ප්‍රයෝග සම්පත්තියෙනි. (2) ගති සම්පත්තියෙනි.

(3) උපධි සම්පත්තියෙනි. (4) කාල සම්පත්තියෙනි.

24. උපයන ධනයෙන් ''ආගන්තුකයින්''හට යුතුකම් ඉටුකිරීම පත්තකම්ම සූත්‍රයේ හඳුන්වන්නේ,

(1) රාජ බලි නමිනි. (2) අතිථි බලි නමිනි.

(3) දේවතා බලි නමිනි. (4) පුබ්බපේත බලි නමිනි.

25. බොරුකීම, කේලාම් කීම, හිස් වචන කිම, රළු වචන කීම යන අකුසල් සතරින් වැළකීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කිනම් අංගයට ඇතුළත් වේද?

(1) සම්මා සමාධියට ය. (2) සම්මා දිට්ඨියට ය.

(3) සම්මා වාචාවට ය. (4) සම්මා වායාමයට ය.

26. බුදුපියාණන් වහන්සේගේ ''නව අරහාදී'' බුදුගුණ වර්ණනා කරමින් පොළොන්නරු යුගයේදී රචිත කෘතිය වූයේ,

(1) අමාවතුරයි. (2) පූජාවලියයි.

(3) සද්ධර්ම රත්නාවලියයි. (4) බුත්සරණයි.

27. පාලකයෙකු පසිඳුරන් පිනවීමට දවසේ වැඩි කාලයක් ගත නොකළ යුතු ය. එය කෙරෙහි ගිජු නොවිය යුතු ය.'' දසරාජ ධර්ම රාජ්‍ය පාලන ධර්ම අතර මෙය

(1) ඍජු බව නම් වේ. (2) මෘදු බව නම් වේ.

(3) අක්‍රෝධය නම් වේ. (4) තපස නම් වේ.

28. ''සත්හට වන බව දුකට වෙදාණන්'' යන කවියෙන් බුදුන් වහන්සේ වෛද්‍යවරයෙකුට උපමා කර ඇත්තේ,

(1) සුභාෂිතයේ ය. (2) බුදුගුණ අලංකාරයේ ය.

(3) ලෝවැඩ සඟරාවේ ය. (4) සිරිත් මල්දමේ ය.

29. මෙලොව පරලොව දෙලොව අභිවෘද්ධිය හේතු වන යුතුකම් හා වගකීම් ඇතුළත් ගිහි විනය ලෙස හඳුන්වා ඇත්තේ සිගාලෝවාද සූත්‍රයයි. එහි ''මිත්තාමච්චා ච උත්තරා'' යනුවෙන් හඳුන්වා ඇති සමාජ කණ්ඩායම නම්

(1) මවුපියන් ය. (2) හිත මිතුරන් ය.

(3) සේවක සේවිකාවන් ය. (4) පුත්‍ර දාරාවන් ය.

30. සෝවාන් ආදී ඵල සිත්වල ඇතිවන දක්ම ධර්මයේ හැඳින්වෙන්නේ,

(1) ඵල සම්මා දිට්ඨියයි. (2) ධ්‍යාන සම්මා දිට්ඨියයි.

(3) මාර්ග සම්මා දිට්ඨියයි. (4) විදර්ශනා සම්මා දිට්ඨියයි.

31. මහින්දාගමන සමයේ ශ්‍රී ලාංකිකයන් ලැබූ දායාද ගණයට අයත් **නොවන** කරුණක් වන්නේ,

(1) ශ්‍රී දළදා වහන්සේ ලැබීමයි. (2) භික්ෂු සමාජය ආරම්භ වීමයි.

(3) අක්ෂර මාලාවක් ලැබීමයි. (4) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලැබීමයි.

32. ස්තූප ආකෘති ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ආකාර සයකි. ඒ අනුව ''බුබ්බුලාකාර'' යනු

(1) ඝණ්ඨාරයක හැඩයයි. (2) දිය බුබුලක හැඩයයි.

(3) පියුමක හැඩයයි. (4) ධාන්‍ය ගොඩක හැඩයයි.

33. කලා කෘති අතර සඳකඩ පහණට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. ඒ අනුව කලාත්මක සඳකඩ පහණ පිහිටා ඇත්තේ,

(1) මිහින්තලේ ය. (2) පොළොන්නරුව වටදාගේ අසල ය.

(3) අනුරාධපුර බිසෝ මාළිගය අසල ය. (4) අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අසල ය.

34. එකල මෙය ඉගෙනීමේ උගතෙකු වීමේ මගක් ලෙස සැලකූ අතර සංස්කෘත මහා කාව්‍යක අන්තර්ගත සර්ග බන්ධන ආදී කාව්‍ය රීති භාවිතයට ගනිමින් ශෘංගාර රසය දනවන ලෙස දඹදෙනි යුගයේදී රචිත කෘතිය වන්නේ,

(1) ධර්ම ප්‍රදීපිකාවයි. (2) කාව්‍යශේඛරයයි.

(3) පූජාවලියයි. (4) කව්සිළුමිණයි.

35. කාමභෝගී ජීවිතයක් ගත කරන ගිහියාට ධනය නිවැරදිව ඉපයීමට අදාළ සූත්‍ර ධර්ම රැසක් දේශනා කර තිබේ. ඒ අතරට ඇතුළත් නොවන සූත්‍රය වන්නේ මින් කුමක් ද?

(1) පත්තකම්ම සූත්‍රයයි. (2) අණන සූත්‍රයයි.

(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (4) රතන සූත්‍රයයි.

36. දෛනිකව අප සැම දෙනා මුහුණ දෙන ගැටලු නිවැරදිව හඳුනාගැනීමට ද එම ගැටලු විසඳා ගැනීමට ද මහෝපකාරී වන ධර්මතාවය වන්නේ,

(1) චතුරාර්ය සත්‍යයයි. (2) අටලෝ දහමයි.

(3) හේතුඵලවාදයයි. (4) ත්‍රිලක්ෂණයයි.

37. බෞද්ධ ආර්ය මාර්ගයේ පියවර තුන නම්

(1) සිත, කය, වචනයයි.

(2) අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥාවයි.

(3) ලෝභ, ද්වේෂ, මෝහයි.

(4) කාම තණ්හා, බව තණ්හා. විභව තණ්හාවයි.

38. වාඩි වී සිටින විට වම් පාදය දකුණු පාදයට යටින් හා දකුණු පාදය වම් පාදවට උඩින් පිහිටන ලෙස තබා හිඳගෙන සිටින ඉරියව්ව හඳුන්වන්නේ,

(1) වීරාසනය ලෙසය. (2) පද්මාසනය ලෙසය.

(3) භද්‍රාසනය ලෙසය. (4) වජ්‍රාසනය ලෙසය.

39. තෙවන ධර්ම සංගායනාවට නායකත්වය හා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ලද දෙපල වූයේ,

(1) මහා කාශ්‍යප හිමි හා අජාසත් රජු ය.

(2) මොග්ගලිපුත්තතිස්ස හිමි හා ධර්මාශෝක රජු ය.

(3) රේවත හිමි හා කණිෂ්ක රජු ය.

(4) සබ්බකාමි හිමි හා කාලාශෝක රජු ය.

40. ''මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවෙයි. මගේ පොතක් වෙන කවුරුන් හෝ මුද්‍රණය කළාට මාගේ විරුද්ධත්වයක් නැත.'' යන ප්‍රකාශය සිදුකළේ,

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමියන් ය.

(2) වැලිවිට අසරණ සරණ සංඝරාජ නාහිමියන් ය.

(3) රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.

(4) සිරි දේවමිත්ත නාහිමියන් ය.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** # බුද්ධ ධර්මය - II **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) බුදු සසුනේ ප්‍රථම වතාවට බුදුන්, දහම්, සරණ ගිය (ද්වේවාචික) උපාසකවරුන් කවුද?

(ii) ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවේදී අත්හල යුතු අන්ත දෙකක් පිළිබඳව පෙන්වා දෙයි. එම අන්ත දෙක කුමක් ද?

(iii) ''ජීවිතය හා ලෝකය පිළිබඳ ඇති යථාතත්වය අවබෝධ කරගැනීම ප්‍රඥාවයි.'' ප්‍රඥාවේ ප්‍රභේද දෙක නම් කරන්න.

(iv) ''දූරං ගමං ඒක චරං - අසරීරං ගුහාසයං...'' මෙහි අර්ථය ලියන්න.

(v) පුද්ගල චරිත 6 ක් දක්වේ. එයින් හතරක් ලියන්න.

(vi) පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතරින් දෙකක් නම් කරන්න.

(vii) මෙතෙක් හමුවී ඇති කලාත්මක බෝධිඝරය පිහිටි ස්ථානය හා එම ස්ථානය අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.

(viii) චතුර්විධ සැප අතර <u>භෝග සුඛය</u> ද එකකි. භෝග සුඛය කෙටියෙන් හඳුන්වන්න.

(ix) සතර බ්‍රහ්ම විහරණ (චතුඅප්පමඤ්ඤා) නම් කරන්න.

(x) නොකළයුතු වෙළඳාම් පහක් බුදු දහමේ පෙන්වාදෙයි. ඒවායින් <u>දෙකක්</u> ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

02 (අ) එක් එක් බෝධියකින් නිවන් අවබෝධ කරන බෝසත්වරු පාරමිතා සම්පූර්ණ කරන පිළිවෙල අනුව තුන් ආකාරය. ඒවා මොනවා ද?

(ආ) බෝසතාණන් වහන්සේ දාන පාරමිතාව පිරූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(ඉ) දැහැමි වූත්, ක්‍රියාශීලි හා මිත්‍රශීලි වූත් බෝධිසත්ව ආදර්ශ ඇති සමාජයක් බිහිකිරීමට පාරමිතා බෙහෙවින් උපකාර වේ. පාරමිතා <u>දෙකක්</u> උදාහරණ වශයෙන් ගෙන මෙය විස්තර කරන්න.

(03) (අ) අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති...... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ආ) එම ගාථාවේ තේරුම ලියන්න.

(ඉ) පුද්ගල ආධ්‍යාත්මික පිරිසිදුකම රැකගැනීම තුළින් දෙලොව ජීවිතය ද ජයගත හැක. ඉහත ගාථාව ඇසුරු කරගෙන පහදන්න.

(04) (අ) සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් මව්පියන් හා ගුරුවරුන් ඇතුළත් දිසා දෙක නම් කරන්න.

(ආ) ශිෂ්‍යයකු වශයෙන් ඔබ ආචාර්යවරයාට පස් අයුරකින් සැලකිය යුතු ය. එයින් තුනක් ලියන්න.

(ඉ) නිසි පරිදි යුතුකම් ඉටුකිරීම තුළින් පුද්ගලයාට හා සමාජයට යහපත විවිධාකාරයෙන් බලපායි. සමාජ කණ්ඩායම් දෙකක් වත් උදාහරණයට ගෙන මෙය පහදන්න.

(05) (අ) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ ආසන්නත ම හේතුව කුමක් ද?

(ආ) ප්‍රථම, දෙවන, තෙවන ධර්ම සංගායනා සඳහා මූලිකත්වය සහ දායකත්වය ලබාදුන් පිරිස නම් කරන්න.

(ඉ) පළමු ධර්ම සංගායනාව බුදු දහමේ චිරස්ථිතිය සඳහා කෙතෙක් දුරට ඉවහල් වූයේ දැයි පැහැදිලි (ප්‍රමාණ) කරන්න.

(06) (අ) ''ඉමස්මිං සති ඉදං හෝති-ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'' මෙහි අර්ථය ලියන්න.

(ආ) පටිච්ච සමුප්පාද ධර්මයෙහි ''සංඛාරා පච්චයා විඤ්ඤාණං'' යන්නෙහි අදහස කෙටියෙන් ලියන්න.

(ඉ) සමාජගත දුක ඇතිවන හා නැතිවන (අනුලෝම-පටිලෝම) ආකාරය පැහැදිලි කිරීමට පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගී කරගත හැකි අයුරු පෙන්වා දෙන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) දුටුගැමුණු මහ රජතුමා

(2) පුරිසදම්මසාරථී ගුණය

(3) සද්ධර්මරත්නාවලිය

(4) ස්තූපය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(4) | 3 -(3) | 4 -(1) | 5 -(1) | 6 -(2) | 7 -(3) | 8 -(4) | 9 -(3) | 10 -(1) |
| 11-(2) | 12 -(3) | 13 -(4) | 14 -(1) | 15 -(2) | 16 -(3) | 17 -(4) | 18 -(4) | 19 -(1) | 20 -(2) |
| 21-(3) | 22 -(4) | 23 -(1) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(4) | 28 -(3) | 29 -(2) | 30 -(1) |
| 31-(1) | 32 -(2) | 33 -(3) | 34 -(4) | 35 -(4) | 36 -(3) | 37 -(2) | 38 -(1) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) තපස්සු භල්ලුක

(ii) කාමසුඛල්ලිකානුයෝගය (ශරීරයට අධික කම් සැප ලබාදීම)
අත්ථකිලමථානුයෝගය (ශරීරයට දැඩි ලෙස දුක් ලබාදීම)

(iii) ලෞකික ප්‍රඥාව (එදිනෙදා කටයුතුවලදී උපකාරවන)
ලෝකෝත්තර ප්‍රඥාව (සෝවාන් ආදී මාර්ග ඵල ලබාගැනීම සඳහා)

(iv) දුර ගමන් කරන, තනිව හැසිරෙන, ශරීරයක් නැති ගුහාවක වෙසෙන සිත දමනය කරන තැනැත්තා මාරයාගේ බැම්මෙන් මිදේ.

(v) රාග, දෝස, මෝහ. සද්ධා, බුද්ධි, විතර්ක

(vi) පොහෝය දිනය, ධර්ම විනිශ්චය, බෞද්ධයාගේ අත්පොත, පාරමිතා ප්‍රකරණය, අභිධර්ම මාර්ගය

(vii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම

(viii) ධාර්මිකව සපයාගත් ධනය පරිභෝජනයෙන් ලබන සැපය

(ix) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා

(x) අවිආයුධ, සත්ත්ව, මස්, වසවිස, මත්ද්‍රව්‍ය වෙළඳාම් වලින් වෙන්වීම

02 (අ) පාරමී - බාහිර වස්තු ආශාව අත්හැරීම.
උපපාරමී - ශරීර අවයව පවා පරිත්‍යාගය
පරමත්ථ පාරමී - තම ජීවිතය පවා කැපකිරීම

(ආ) දාන පාරමිතාව ලෙස තමන් සතු සියලු ධනය දන්දීම උදාහරණ වෙස්සන්තර ජාතකය දාන පාරමිතාව ලෙස තමන්ගේ ශරීර අවයව පවා දන්දීම. සිවි ජාතකය පරමත්ථ පාරමී ලෙස තම ශරීරය දන්දීම සස ජාතකය

(ඉ) දානය පූජාවක් ලෙස හෝ අනුග්‍රහයක් ලෙස පරිත්‍යාග කිරීමෙන් ද
සීලය කය, වචන සංවරවීමෙන් බියෙන්, සැකෙන් තොරව ජීවත්වීමෙන් සාමයෙන්, සමගියෙන් නෙක්ඛම්ම අසීමිත ආශාවන්ගෙන් තොරව අල්පෙච්ඡතාවයෙන් මැදිහත් බවින් සැහැල්ලු මනසින් යුතුව ප්‍රඥා නුවණින් කටයුතු කිරීම සමාජගත ජීවිතයට ඉතා වැදගත් ය. නිවැරදි දැක්ම, සාර්ථකත්වයට ඉවහල් වීම

වීර්ය - යමක් සාර්ථකව ඉටුකරගන්නා තුරු නොපසුබට උත්සාහය අවශ්‍ය වේ. විභාග ජය ලැබීමට සමාජ ගෞරවයට වීර්ය ඉවහල් වේ.

ක්ෂාන්ති - ඉවසීමෙන් යුතුවීම අටලෝ දහමින් කම්පා නොවීම, කුපිතවීමෙන්, පළිගැනීමෙන් වෙන්ව අන්මත ඉවසා සමගිසම්පන්න ජීවිත ගත කිරීමට, ගැටුම් වලින් වැළකී සාමයෙන් සිටීමට ඉවහල් වේ.

අධිෂ්ඨානය - සමාජ ජීවිතයේදී ජය ගැනීමට උපකාරී වේ. චිත්ත ශක්තිය, අධිෂ්ඨානයෙන් කටයුතු කිරීමෙන් ජීවිත වඩා සාර්ථක වේ.

මෛත්‍රිය - බ්‍රහ්ම විහරණයන් හෙවත් උත්තම චර්යාවකි. ද්විපක්ෂ තොරව මිත්‍රත්වය දැක්වීම

උපේක්ෂාව - මැදිහත් බවින් යුතුව ඇලීම් ගැලීම් වලින් තොරවීමෙන් සමබර පෞරුෂය වර්ධනයට ඉවහල් වේ.

ඉහත දැක්වුන පරිදි දස පාරමිතාවන් පුද්ගල ජීවිතය මනා සංවර්ධනයට ඉවහල් වේ. ජීවිත වටිනා ජීවිත බවට පත්වීමටත් දැහැමිවූත්, ක්‍රියාශීලී මිත්‍රශීලී බෝධිසත්ත්ව ආදර්ශ ඇති සමාජයක් සඳහා දස පාරමිතා ඉවහල් වේ.

(03) (අ) අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤො මඤ්ඤෙ විසෝධයෙ

(ආ) යමෙක් පව් කළහොත් එයින් ඔහුම කෙලෙසෙන්නේ ය. යමෙක් පව් නොකළහොත් ඔහුම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතිනුයේ තමා වෙතමය. යමෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

(ඉ) පුද්ගලයාගේ පිරිසිදු බව ඉතා වැදගත් ය. ඔහු නරක පින් පව් මත මෙලොව - පරලොව වශයෙන් දුක් කම්කටොලු හෝ සැප ලැබීමට ඉවහල් වේ. තමා විසින් කරන ලද පව් හෝ පින් හේතුවෙන් ලබන පිරිසිදු බව හෝ අපිරිසිදු බව අනෙකෙකුට ලබාදිය නොහැකි ය. මෙලොව පරලොව දියුණුවට එය සෘජුවම බලපායි.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(04) (අ) නැගෙනහිර - මව්පියන් / දකුණු - ගුරුවරුන්

(ආ) දුටුවිට හුනස්නෙන් නැගිටීම / අවශ්‍ය උපස්ථාන කිරීම / අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම / අවශ්‍ය කටයුතු ඉටුකරදීම / මැනවින් ඉගෙන ගැනීම

(ඉ) දෙමාපියන් හා දරුවන් අතර නොමනාපකම් නිසා දෙපිරිසම දුකට, කණගාටුවට පත්වේ. යුතුකම් ඉටුකිරීමෙන් දෙපිරිසම සැනසිලිදායක ජීවිත ගත කරයි. ගුරු-සිසු යුතුකම් නිසි පරිදි ඉටුකිරීමෙන් පරමාදර්ශී යහපත් සමාජයක් බිහිවේ. ශිෂ්‍යයන් විශ්වාසයෙන් උපදෙස් පිළිගනිමින් ඇල්මෙන් ක්‍රියා කළ යුතුය. ගුරුවරයා ද දයාවෙන්, කරුණාවෙන් ක්‍රියා කිරීමෙන් යහපත උදාවේ.

අඹු-සැමි සබඳතා බිඳවැටීම නිසා පවුල් අර්බුධයට ලක්වේ. පවුලේ සාමය, ප්‍රීතිය නැතිවේ. පිරිස අසරණ වේ. දියුණුව නැතිවේ. කල්‍යාණ මිත්‍ර ඇසුර අධ්‍යාත්මික දියුණුවට බාහිර දියුණුවට මෙන්ම මෙලොව - පරලොව දියුණුවට හේතුවේ. නිසි පරිදි යුතුකම් ඉටුකිරීමෙන් දෙපිරිසේම සුහදතාව වර්ධනය වේ. පාප මිතුරන්ගෙන් වෙන්වීමද කලණ මිතුරන් ඇසුරද, පුද්ගල සමාජයේ යහපතට හේතුවේ.

වර්තමාන සමාජයේ සේව්‍ය-සේවක ගැටුම් බහුලය. දෙපිරිසටම සේවා ස්ථානය ප්‍රසන්න ස්ථානයක් වීමට දෙපිරිසම යුතුකම් හා වගකීම් ඉටුකිරීම බලපායි. වංචනික ක්‍රියා අඩුවී යහපත උදාවන්නේ එවිටය. දැහැමි සමාජයක පදනම මනා ගිහි-පැවිදි සබඳතාවයයි. ගිහියා පැවිදි උතුමන්ට රක්ෂණය, පෝෂණය ලබාදිය යුතුය. පැවිදි උතුමන් ආමිසයෙන් සලකන ගිහියාට ධර්මදානයෙන්, මගපෙන්වාදීමෙන් ක්‍රියා කරයි.

සදිසා සංග්‍රහයේ යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටුවීමෙන් එකිනෙක කණ්ඩායම්වල අන්‍යෝන්‍ය විශ්වාසය, බැඳීම ඇතිවේ. හුදෙකලා බව පහවේ. දුක - සැප බෙදාගෙන ජීවත්වේ. අනවශ්‍ය ගැටුම් කෝලාහල බිඳවැටීම්, විවේචන සමාජයෙන් තුරන් වේ. සාමය සමගිය තහවුරු වේ. සමාජයේ යහපතට ඉවහල් වේ.

05 (අ) සුභද්‍ර භික්ෂුවගේ (අභද්‍ර, අශ්ශිල, අනදර) නුදුසුදු වචනය නිසා

(ආ) පළමු ධම් සංඝායනාව - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, අජාසත් රජු

දෙවන ධම් සංඝායනාව - සබ්බකාමී මහරහතන් වහන්සේ - කාලාශෝක රජු

තුන්වන ධම් සංඝායනාව - මොග්ගලිපුත්ත තිස්ස මහරහතන් වහන්සේ - ධර්මාශෝක රජතුමා

(ඉ) * විසිරී තිබූ ධම් විනය ඒකරාශී කර සම්මුතියකට ගෙනඒම.

* ධම් විනය කොටස්කර භාණක පරපුරකට පැවරීම.

* ධම්ය කොටස් මුඛ පරම්පරාගතව රැකගෙන ඉදිරියට පවත්වා ගැනිම.

| | |
|---|---|
| දීඝ නිකාය | - ආනන්ද හිමි ප්‍රධාන ශිෂ්‍ය පරපුර |
| මජ්ඣිම නිකාය | - සැරියුත් හිමි ප්‍රධාන ශිෂ්‍ය පරපුර |
| අංගුත්තර නිකාය | - අනුරුද්ධ හිමි ප්‍රධාන ශිෂ්‍ය පරපුර |
| සංයුක්ත නිකාය | - මහාකාශ්‍යප හිමි ප්‍රධාන ශිෂ්‍ය පරපුර |
| ඛුද්දක නිකාය | - සියලු භික්ෂූන් වහන්සේලාට |

විනය පස් අයුරින් සංග්‍රහ විය. පාරාජිකා පාලි, පාචිත්ත පාලි, චුල්ලවග්ග පාලි, මහාවග්ග පාලි, පරිවාර පාලි, විනය පිටකය උපාලි තෙරුන් ප්‍රධාන පිරිසට පැවරීම

කුඩා අනුකුඩා ශික්ෂා පද - වෙනස් නොකිරීමටද, ශාසන චිරස්ථිතිය සඳහා ගන්නා ලද පියවර නිසා බුදුන් ජීවමාන අවධියේ සිට පැවති දූරමතධාරින්ගෙන් සසුන ආරක්ෂා කොට ශාසන චිරස්ථිතිය සඳහා ගන්නා වූ මුල් පියවර වූ පළමු සංඝායනාව බව පැහැදිලි ය.

(06) (අ) මෙය ඇති කල්හි මෙය ඇතිවේ.

මෙය හටගැනීමෙන් මෙය හටගනී.

(ආ) කුසලාකුසල කම් රැස් කිරීම නිසා ප්‍රතිසන්ධි සිත පහළ වේ.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(ඉ) හේතුඵල දහමින් සසර දුක ඇතිවන අයුරුත් එය නැතිවන අයුරුත් පෙන්වා දේ. අනුලෝම පටිච්චසමුප්පාදයෙන් සසර දුක ඇතිවන ආකාරය විස්තර කෙරේ. පටිලෝම පටිච්චසමුප්පාදයෙන් දුක නැතිකිරීම විග්‍රහ වේ.

මහා නිදාන සූත්‍රයේ තණ්හාව නිසා සමාජ කලකෝලාහල ඇතිවන අයුරු පෙන්වා දේ.

චක්කවත්ති සීහනාද සූත්‍රයට අනුව දුප්පත්කම සමාජ ගැටලුවකි. එය නැති කිරීමට නම් දිළින්දන්ට ධනය ලැබීමෙන් දිළිඳුකම නැතිවේ. දිළිඳුකම නැතිවූ විට සොරකම නැතිවේ. අවි ආයුධ නැතිවූ විට ප්‍රාණඝාතය නැතිවේ. ප්‍රාණඝාතය නැතිවූ විට බොරුව. කේලම නැතිවේ. මේ නිසා අනිසි කාම සේවනය නැතිවේ. එසේ වූ විට රළු වචන හා හිස් වචන නැතිවේ. මේ ආදී වශයෙන් සමාජ දුක නැතිවූ විට මව්පියන්ට පැවිද්දන්ට ගරු කරන කුල දෙටුවන් පුදන සමාජයක් බිහිවේ. ඉහත අයුරින් ප්‍රශ්න ඇතිවීම හා නැතිවීම වන අයුරු පටිච්චසමුප්පාදිව බැලිය හැක. මේ නිසාම මිනිස් ජීවිත හා බැඳුණ සංතානගත හා සමාජ දුක් දොම්නස් පටිච්ච සමුප්පාදිව සිදුවන බව පිළිගත හැක. එදිනෙදා ගැටලුවලට විසඳුමද සංසාරගත දුක් මෙන්ම සමාජ දුකද සිදුවන බව පැහැදිලිය.

07 (1) <u>දුටුගැමුණු මහරජතුමා</u>

දුටුගැමුණු රජතුමාගේ පරමාදර්ශය වූයේ ''මාගේ මේ ව්‍යායාමය බුදු සසුනේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙක රජ සැප සඳහා නොවේ.'' විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට ජාතිය, බුදු සසුන ආරක්ෂා කර ගැනීමට විශාල සේවාවක් කළේය. රුවන්වැලිසෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය රජතුමාගේ සදානුස්මරණීය ඉදිකිරීම් අතර ප්‍රධානය. වසර 24 ක රාජ්‍ය පාලන කාලය තුළ සිදුකළ පුන්‍ය ක්‍රියා පිං පොතක ලියා තැබීය. එසේම රාජ්‍ය වෙසක් උත්සවය 24 ක් ද සිදුකරන ලදී.

(2) <u>පුරිසදම්ම සාරථී ගුණය</u>

බුදුන් වහන්සේට මනුෂ්‍ය, තිරිසන්, යක්ෂ, දේව. බ්‍රහ්ම ආදී පිරිස් අතර වූ නොහික්මුණ පිරිස් හික්මවාලීමේ බලයක් විය. එය නව අරහාදී බුදුගුණ අතර පුරිසදම්ම සාරථී ලෙස දක්වේ.

මෙසේ දමනය කළ අය අතර අංගුලිමාල, ආලවක, සච්චක, උපාලි ගෘහපති, තුන්බෑ ජටිලයන්, උදාහරණ වේ. මේ සියලුදෙනා බුදුන්වහන්සේ දමනය කරන ලද්දේ ආධ්‍යාත්මික ශක්තිය හා ගුණ බලය මගිනි. බුදුන් වහන්සේ දමනය කළ සත්වයන් පිළිබඳව ගුරුළුගෝමීන්ගේ අමාවතුර කෘතියේදී බොහෝ විස්තර දක්වේ.

(3) <u>සද්ධර්ම රත්නාවලිය</u>

''සද්ධර්මය නැමති මිණි කැට ඇමිණූ මාලය'' නම් සද්ධර්මරත්නාවලිය දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන්ගේ කෘතියකි. පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් රචනා කර ඇති බව පෙනේ.

ගැමි වහරට සමීප වූ උපමා උපමේය බහුලව යොදා ඇත. ගැමි ජනයාට සමීප වහරින් කථාන්තර රීතිය මෙහි ජනප්‍රියත්වය වැඩි කිරීමට හේතු වී ඇත. මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් කියන්නේ ''දඹදිව උපන් කථා'' වුවද මෙරට උපන් කථා ලෙස සැකැසීමට ධර්මසේන හිමියන්ට හැකිවූයේ ගැමි ජීවිතයෙන් ලද අත්දැකීම් නිසාය. ඒවා ගැමි හදවත්වලට සමීප වූ බවය. එයින් මතුවන්නේ පුස්කොළ පොත් සුවඳ නොව ගැමි ජීවිතයේ සුවඳ ය.

(4) <u>ස්තූපය</u>

ස්තූපය. චෛත්‍ය. සෑය. දාගැබ, ථූපය, චේතිය නම්වලින් හැඳින්වේ. ත්‍රිවිධ චෛත්‍ය වන්දනා අතුරින් පළමුව වන්දනා කරනු ලබන්නේ ස්ථූපයටය. බුදුන් වහන්සේගේ හා මහරහතන්වහන්සේලාගේ ධාතු ස්ථූප ගර්භයේ තැන්පත්ව පවතී.

ලංකාවේ ස්ථූප ආකෘතියෙන්ම ඉදිවූ පළමු ස්ථූපය ලෙස සැලකෙනුයේ ථූපාරාම චෛත්‍යයයි. එහි බුදුන්ගේ දකුණු අකු ධාතු නිධන්ව පවතී. මහාවංශයේ සඳහන් පරිදි ලංකාවේ පළමු ස්ථූපය වන්නේ මහියංගනයයි. එහි බුදුන් වහන්සේගේ කේස ධාතු නිධන්ව පවතී.

ස්ථූපයේ ආකෘති 6 කි. ඝණ්ඨාකාර, ඝඨාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර. පද්මාකාර, අම්ලාකාර වේ. ශ්‍රී ලංකාවේ විශාලතම ස්ථූප අතර රුවන්වැලි සෑය, ජේතවනාරාමය, අභයගිරිය. මිරිසවැටිය ප්‍රධානය. කුඩා ස්ථූපවටා වටදාගෙවල් වූ බවට ථූපාරාමය, අම්බස්ථලය, ලංකාරාමය, මැදිරිගිරිය උදාහරණ වේ.